# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 11
NUMBER 08

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

NOVEMBER 10, 2008 නොවැම්බර් මාසය (බුද්ධ වර්ෂ 2552 ඉල් මාසය)




Miss Sri Lanka - Anjali Dissanayake අන්ජලි දිසානායක

# මේ කැගහන කාලයයි!

♦ සංජය විමලරත්න

**ව**න්නි ක්‍රියාදාමය ස්ථාවරයකින් යුක්තව දිගටම කෙරීගෙන යයි. අපේ වීරෝදාර හමුදාවෝ දිනෙන් දින ඊසාන දෙසින් කිලිනොච්චි නගරය වෙතට පිය ඔසවති. මේ ලියන මොහොතේ මන්නාරමේ සිට පූනරින් දක්වා **A 32** මාර්ගය මුළුමනින් ඔවුන්ගේ අණසකට නතුව පවතී. කිලිනොච්චි නගරයට දකුණු දෙසින් වූ පලේයිල්කුලම් සහ උරුතිරපුරම් යන ප්‍රදේශ යන්හි දැන් දරුණු සටන් සිදුවේ. එහිදී කොටි සාමාජිකයන් බොහෝ දෙනෙකු මෙන්ම මුදු කොටි කල්ලියේ ජ්‍යෙෂ්ඨයෙකු ද මිය ගොස් ඇති බව පුවත්පත් වාර්තා මගින් එළිකර ඇත.

අප කලින්ද පෙන්වා දී ඇති පරිදි කොටි තම කිලිනොච්චි මූලස්ථානය රැකගැනීමට කරන මේ අවසාන සටන සඳහා ඔවුන්ගේ හොඳම සහ පුහුණු කාඩරයන් ද සහිත සියළු වැරවීරිය යොදවා ඇත. සැබැවින්ම මෙම සටන දැන් වඩාත් දරුණු අතට හැරී ඇත්තේ ඒ නිසාය. වර්ෂා කාලය ද පැමිණ ඇති බැවින් රජයේ සන්නද්ධ හමුදා හෙමින් නමුත් ඉතා සාර්ථකව ඉදිරියට යමින් ජයග්‍රහණය වෙතට කෙමෙන් ළංවෙමින් සිටිති.

දැන් කෑගහන, උඩබුරන කාලය පටන් ගෙන තිබේ. සමහරු නොයිවසිලිවන්තව හමුදා ඉක්මනින්න කිලිනොච්චිය අල්ලා නොගන්නේ මන්දැයි අසති. පැරණි සිංහල කියමනෙහි මෙන් බතල සිටුවා අලබහින කල් සිටින්නට හැකි නමුත් ලිපේ එය තැම්බෙනතෙක් ඉන්නට ඉවසුමක් නැත. මෙහිදී අපට ස්ථිරවම කිව හැකි දෙයක් නම් කොටි ත්‍රස්තවාදීන්ට ඔවුන් අල්ලාගෙන සිටි උතුරු නැගෙණහිර බිම් ප්‍රදේශ සීඝ්‍රයෙන් දවසගානේ අහිමිවී යමින් ඇති බවයි.

උතුරු නැගෙණහිර සටන්බිමේ තත්වය ගැන කතා කරන අතරේම කොළඹ ඇතැම් වාචාල පිරිස් අතරේ පසුගිය සති දෙක තුන තුළ විෂය වූයේ කොටි ගුවන්යානා කැළණිතිස්ස බලාගාරයට සහ මන්නාරමේ හමුදා කඳවුරකට බෝම්බ හෙළීම ගැනයි. මෙම ප්‍රහාරයෙන් කොටින්ගේ අරමුණ වූයේ උතුරේ සටන්බිමේ ඔවුන් මුහුණ පා ඇති පරාජය කෙරෙහි ලෝකයා දක්වන අවධානය වෙන අතකට යොමුකිරීමය. කොටි පාක්ෂික මාධ්‍යකාරයින් මෙහිදී කොටි සංවිධානය හුවාදක්වමින් ඔවුන්ගේ ගුවන් බලය ලංකා රජයේ ගුවන්හමුදාවේ බලය හා සමානව පවතින බව කියන්නට උත්සාහ ගෙන තිබුණි. කොටින්ගේ කැලි පුරුද්දා අටවාගත් ගුවන් යානා දෙක තුනක් කෙසේනම් ලංකා ගුවන්හමුදාවේ ප්‍රහාරක බලයට සමාන කළ හැකි ද?

මෙම කොටි ගුවන් ප්‍රහාරයේ තවත් පැත්තක් ගැනද දැන් සැක මතුවී ඇත. එනම් එපමණ දුරක් කොළඹට පැමිණ හරියටම හරි ස්ථානයට බෝම්බ හෙලා යන්නට කිලිනොච්චි කලෑවේ පඳුරු අස්සේ හැංගිමුත්තන් ගහන කොටින්ට හැකියාවක් ඇත්ද යන්නයි. හොඳට පුහුණු වූ, කුලියට සේවය කරන විදේශික ගුවන් නියමුවන් ඉන්දියන් සාගරයේ නැවක සිට මෙම ගුවන්යානා පදවාගෙන එන්නට ඇතැයි යන සිතුවිල්ල ද හමුදා ප්‍රධානීන්ගේ සැලකිල්ලට හසුව තිබේ. එවැනි දෙයක් යළි නොවන්නට අපේ ගුවන්හමුදාව අවශ්‍ය පියවර ගන්නවා ඇතැයි අපේ විශ්වාසයයි.

## ඉන්දියාව, තමිල්නාඩුව සහ අප

## වැඩ ඉවරනැති දෙමළ චිත්‍රපටිය

පසුගිය සතිකීපය තුළ කාගේත් කතා බහට ලක්වූ අනෙක් මාතෘකාව නම් ලංකාවේ කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව ගෙනයන සටනට තමිල් නාඩුවේ දේශපාලන සහ අනෙක් කණ්ඩායම් කරන දැහලිල්ල ගැන ය. කොටින්ට ගහන ගැහිල්ල නැවැත්වීමට තමිල්නාඩුකාරයින් වක්‍ර ව යොදාගෙන ඇත්තේ උතුරේ සහෝදර දෙමළ ජනයා කන්න බොන්න හා ඉන්න තැනක් නැතුව දැඩිදුක් විඳිනබවක් ගැන කෑගැසීමටයි. උතුරේ දෙමළ වැසියන් අල්ලා සිරකරගෙන, මිනිස් පලිහක් කරගෙන සිටින්නේ කොටින්ය. තමිල්නාඩුව පමණක් නොව ලොව සියළුම දෙමළ ජනයා ඒ බව දනිති. එහෙත් කොටි වෙබ්අඩවි හා කොටි හිතවාදී දෙමළ ජාතිකයන් ලෝකයාගේ අනුකම්පාව ලබාගන්නට කියන්නේ ලංකා හමුදාව කරන සටන් නිසා දෙමළ ජනයා දුක්විඳින බවයි.

තමිල්නාඩුවේ මහ ඇමති වන කරුණානිධි තවත් අවස්ථාවාදියෙකු වන වයිකෝ ඇතුළු පිරිස් ලංකාවේ දෙමළ ජනයා මුදාගත යුතුයයි මහාඝෝෂාවක් කළබැගෑනියක් පටන්ගත්හ. ඊට විපක්ෂයේ ජයලලිතා ද එක්වී ඇත. මේ සියල්ල දෙමළ චිත්‍රපටයක කතාවක් වැන්න. ඒ යෙදුම වඩාත් ගැලපෙන්නේ කරුණානිධි අතීතයේ සැබැවින්ම දෙමළ චිත්‍රපටවල දෙබස් හා

4 වන පිටුව බලන්න →

නෙත සිත ඇදෙන ලෙස හැඩ වැඩ වනු පිණිස
ඇ ත රුචි බවක් ගෙන එන යව්වන වයස
ය ත වියපත්ව දුටු කල යුගයක වෙනස
ම ත කය දිගේ එයි මෙම සුන්දර දවස

To dress in elegant garb that's in vogue what may
Is a desire goes with the young age, so they say
Comes the maturity, seeing the era in diverse way
Memory will surely usher in the grace of this day

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ransinghe*




ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/


